**සංචාරක සංවර්ධන අරමුදල - 2017**
**---------------------------------------------**

සංචාරක සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීතිරීති,රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24(3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 169(2) | චෙක්පත් උපලබ්ධි වීමට පෙර ආයතනය සේවා සපයා තිබීම හේතුවෙන් චෙක්පත් 07 කට අදාළව රු.143,505 ක මුදලක් අයකර ගැනිමට නොහැකිව තිබුණි. |

## 2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පරිපාලන වියදම් ගෙවීම සඳහා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන සලසා නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් ලෙස රු.7,765,924 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ආදායම රු.මිලියන 3,933 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.මිලියන 3,644 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු. මිලියන 289 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි සංචාරක සංවර්ධන බදු ආදායම රු. මිලියන 265 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

2003 අංක 25 දරන මුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව එකතු කරන අපගමන බදු මුදලින් 1/3 හා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනත යටතේ ඇති සංචාරක සංවර්ධන බදු මුදල, අරමුදලේ ආදායම වන අතර එය සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය හෝ සංවර්ධනය උදෙසා දරන ලද වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත පිළිවෙලින් සියයට 70 ත් 12 ත් 14 ත් සහ 4 ක් බැගින් ලබා දීමට පනතින් ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී යථෝක්ත ආයතන වෙත පිළිවෙලින් රු.2,747,251,224 ක්, රු.470,957,352 ක් රු.549,450,245 ක් හා රු.156,985,784 ක් වශයෙන් එකතු වටිනාකම රු.3,924,644,605 ක් ලබා දී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) වගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කලයුතු වුවත් එලෙස නැව් මඟින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණි. 2017 වර්ෂය තුළදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව මගීන් 27565 ක් පිටත්ව ගොස් ඇති බැවින් ඒ වෙනුවෙන් එක මගියෙකුගෙන් ඇමරිකානු ඩොලර් 1.66 බැගින් සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදලට ලැබිය යුතු රු. 6,406,106 ක අපගමන බදු ආදායම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ගුවන් මගින් පිටව ගොස් ඇති වයස අවුරුදු 02 ට වැඩි ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව 3,653,370 ක් වූ බැවින් අරමුදලට ගුවන් මගින් පිටත්ව ගිය මගින් වෙනුවෙන් රු 2,557,359,000 අපගමන බදු ආදායමක් ලැබිය යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සංචාරක සංවර්ධන අරමුදලේ අපගමන බදු ලෙස වාර්තා වී තිබුනේ රු.2,378,828,212 කි. ඒ අනුව රු.178,530,788 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
| --- | --- | --- |
| (අ) අපගමන බදු එකතු කිරීම. | (i) | නැව් මඟින් ගමන් කරන මගීන්ගෙන් බදු අය නොකිරීම |
| | (ii) | ගුවන් මගින් ගමන් කරන මගීන්ගෙන් අයකරන බදු, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව නොසැසඳීම. |
| (ආ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම | | පාරිභෝගිකයන්ගෙන් අයකර තිබූ බදු ප්‍රමාණය හා අරමුදලට අය වී තිබූ බදු මුදල් අතර වෙනස්කම් පැවතීම. |